**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

# ජාතික යොවුන් සේනාංකය

## ඇබෑර්තු

**ජාතික යොවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති**
**පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) (HM 1-1)**
**02. සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) (MM 1-1)**

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම.

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

## 01. අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) (HM 1-1) - මූලස්ථානය සඳහා

**අධ්‍යාපන සුදුසුකම් :- බාහිර අයදුම්කරුවන්**

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ) විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) විශේෂ, නීතිවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය), ශාස්ත්‍රවේදී (ගෞරව) යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සමග**

රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, නීති විෂයයන්, සේවක හා මානව සම්පත් කළමනාකරණය, දේශපාලන විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන, අධ්‍යාපන හා මනෝ විද්‍යා සංවර්ධනය පිළිබඳව පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් පුහුණු හා සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සේවා (MM) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**වැටුප් ක්‍රමය**:- HM 1-1 - 2/2016 රු.81,670-15X2,270 = රු.115,720
මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

## 02. සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) (MM 1-1) - මූලස්ථානය සඳහා

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ) විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ, නීතිවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ අවම වසර දෙක (02) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය**:- MM 1-1- 2/2016 රු.53,175-10X1,375-15X1,910 = රු.95,575
මීට අමතරව රජයේ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

මෙම තනතුරු සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව ඉල්ලුම්පත්‍රයක් පිළියෙළ කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2021.08.26 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ vacancy@youthcorps.lk යන විද්‍යුත් තැපැල මගින් අයදුම්පත් යොමු කළයුතු වේ.

අසම්පූර්ණ, අදාළ සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ජාතික යොවුන් සේනාංක මූලස්ථානය,**
**අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

**සභාපති,**
**ජාතික යොවුන් සේනාංකය.**
**2021.08.13**